**ශ්‍රී ලංකා දුම්රිය සේවය**

**ප්‍රසම්පාදන දැන්වීමයි**

**ශ්‍රී ලංකා දුම්රිය දෙපාර්තමේන්තුවට අයත් කොළඹ ගෙදර නවාතැන්පළ බදුලබාදීම සඳහා ප්‍රසම්පාදන කමිටු ලංසු කැඳවීමයි.**

ශ්‍රී ලංකා දුම්රිය දෙපාර්තමේන්තුව වෙනුවෙන් දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටු සභාපති විසින් කොළඹ කොටුව දුම්රිය පරිශ්‍රයේ පාවෙන වෙළඳ සංකීර්ණයට යාබදව පිහිටි "කොළඹ ගෙදර නවාතැන්පළ" ගොඩනැගිල්ල නවාතැන්පල සේවාවන් පවත්වාගෙන යාම සඳහා වසර පහක කාලයකට බදු ලබාදීම පිනිස ලංසු කරුවන් වෙතින් මුද්‍රා තබන ලද ප්‍රසම්පාදන ලංසුපත් කැඳවනු ලැබේ.

**01.සුදුසුකම්**

I. මෙම කොන්ත්‍රාත්තුවට අදාල ව්‍යාපරය හෝ සමාගම, ව්‍යාපාර නාම ලියාපදිංචිය යටතේ/සමාගම් ලියාපදිංචිය යටතේ, ශ්‍රී ලංකාව තුළ ලියාපදිංචිකර වලංගු ලියාපදිංචි සහතිකයක් තිබිය යුතුය.

II. සෑම අයදුම්කරුවකුම/ආයතනයක්ම ශ්‍රී ලංකාව තුල පිළිගත් ආයතනයක / ආයතනවල සමාන සේවා සැපයීම පිළිබඳව අවම වශයෙන් වසර 02ක පලපුරුද්දක් සහිත විය යුතුය.

III. සෑම අයදුම්කරුවකුම/ආයතනයක්ම සංචාරක මණ්ඩලයේ වලංගු ලියාපදිංචි සහතිකයක් සහිත විය යුතුය (ටෙන්ඩර් කැඳවන දිනට).

IV. අදාල ව්‍යාපාරය සාර්ථකව කරගෙන යාහැකි බවට ප්‍රමාණවත් මූල්‍යමය ස්ථාවරත්වයක් ඇති බවට පසුගිය වසර 02ක් සඳහා වූ විගණන වාර්තා මගින් හෝ බැංකු ප්‍රකාශන මගින් සනාථ කළයුතුය.

**02.ලංසු අයදුම්පත්‍ර ලබාගැනීම**

ටෙන්ඩර් අයදුම්පත් 2024 ජනවාරි මස 16 වන දින ප.ව 02.00 දක්වා දුම්රිය වෙළඳ හා අලෙවි කාර්යාලයෙන් ලබා ගත හැක. ඒ සඳහා කොළඹ 10 ශ්‍රී ලංකා දුම්රිය සේවයේ ප්‍රධාන මූල්‍ය නිලධාරි වෙත ආපසු ගෙවනු නොලබන ලංසු පෝරම ගාස්තුව ලෙස රු.2,500/- ක මුදලක් ගෙවා ලබා ගන්නා ලද ලදුපත දුම්රිය මූලස්ථානයේ නියෝජ්‍ය අධිකාරි (වෙළඳ හා අලෙවි) වෙත ඉදිරිපත් කළ යුතුය. ලංසු පෝරම ගාස්තුවට අමතරව ආපසු ගෙවනු ලබන ලංසු බැදුම්කර ඇප මුදල ලෙස රු. 610,000.00 ක මුදලක් දෙපාර්තමේන්තුව වෙත ගෙවිය යුතුය. එම ලංසු බැදුම්කර ඇප මුදල දුම්රිය මූලස්ථානයේ ප්‍රධාන මූල්‍ය ගණකාධිකාරි වෙත ශ්‍රී ලංකාවේ වලංගු මුදලින් ගෙවා ලබාගත් ලදුපත (මුල් පිටපත) ටෙන්ඩර් ඉල්ලුම්පත සමග ඉදිරිපත් කළ යුතුය.

**03. ලංසු අයදුම්පත්‍ර ඉදිරිපත් කිරීම**

ඉහත 02 යටතේ සඳහන් ආකාරයට ලබාගන්නා ලද අයදුම්පත්‍ර මුල් පිටපත හා අනු පිටපත නිසි පරිදි සම්පූර්ණ කර කවර දෙකක බහා මුද්‍රා තැබිය යුතුය. එම කවරවල මුල් පිටපත හා අනුපිටපත ලෙස පැහැදිලිව සඳහන්කළ යුතුය. එම කවර දෙක තනිකවරයක බහා වම් පස ඉහල කෙළවරේ "කොළඹ ගෙදර නවාතැන්පළ සඳහා මිල ගණන් කැඳවීම" යනුවෙන් සඳහන් කොට, එම කවරය මුද්‍රා තබා 2024 ජනවාරි මස 17 වන දින ප.ව 02.00 පෙර ලැබෙන සේ සභාපති, දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුව, වෙළඳ හා අලෙවි අංශය, දුම්රිය මූලස්ථානය, ඕල්කට් මාවත, කොළඹ 10 ලිපිනයට ලියාපදිංචි තැපැලෙන් එවීමට හෝ දුම්රිය මූලස්ථාන නියෝජ්‍ය අධිකාරි (වෙළඳ හා අලෙවි) ගේ නිල කාමරයෙහි ටෙන්ඩර්පත් බහාලීම සඳහා සකසා ඇති විශේෂ ටෙන්ඩර් පෙට්ටියේ බහාලීමට හෝ කටයුතු කළ යුතුය. එම වේලාවෙන් පසුව ලැබෙන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ. තැපැලේදී ප්‍රමාදවූ හා නැතිවූ අයදුම්පත් පිළිබඳව සලකා බලනු නොලැබේ.

**04. ලංසු අයදුම්පත් විවෘත කිරීම**

2024 ජනවාරි මස 17 වන දින ප.ව. 02.00 ට ඉහත 03 ඡේදයේ දක්වා ඇති පරිදි වෙළඳ හා අලෙවි කාර්යාලයේදී අයදුම්පත් විවෘත කරනු ලබන අතර, එම අවස්ථාවට අයදුම්කරුට හෝ ඔහුගේ බලයලත් එක් නියෝජිතයෙකුට හෝ සහභාගී වීමට ඉඩදෙනු ලැබේ.

**05.** ලංසු අයදුම් කිරීමට ප්‍රථම ඉහත සඳහන් ගොඩනැගිල්ල පරීක්ෂා කිරීම සඳහා අයදුම්කරුවන් හට අවස්ථාව ලබා දෙන අතර ඒ සඳහා නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (වාණිජ) මගින් අවසර ලබාගතයුතු වේ.

**06.** දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුවේ තීරණය අවසාන තීරණය වේ.

**07.** ලංසුකරුවන්ට වැඩි විස්තර අවශ්‍ය නම් දුරකථන අංක :-011-2421281 – (දිගු අංකය -8235) හරහා ශ්‍රී ලංකා දුම්රිය සේවයේ වෙළඳ හා අලෙවි කාර්යාලය වෙතින් ලබාගත හැක.

සභාපති,<br>
දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුව,<br>
දුම්රිය මූලස්ථානය,<br>
ඕල්කට් මාවත, කොළඹ 10.